Lesson 45 **ඔයා ඇත්ත කියන එක හොදයි**

මෙහිදී අපි ඉගෙන ගන්නේ තවත් ප්‍රයෝජනවත් ව්‍යාකරණ රටාවක්. මේ ව්‍යාකරණ රටාවෙන් කියන්නේ යම් ක්‍රියාවක් කරන එක හොදයි කියලා. ඒ කියන්නේ යම් ක්‍රියාවක් කරන එක ගුණයි, එය වඩා හොදයි, එය කරන එක මම නිර්දේශ කරනවා වගේ අර්ථයක් ඉන් කියවෙන්නේ . එහි වාක්‍යය සැදෙන්නේ මේ ආකාරයට

- කතෘ + had better + ක්‍රියාව

  කතෘ ඒක වචන වුනත් බහු වචන වුනත් මේ රටාව මේ විදියට තමයි යෙදෙන්නේ (මෙහි had කියන වචනේ ආවට එය has / have වල අතීත කාලය සමග කිසිඳු සම්බන්දයක් නැහැ. මෙතනදී ඒ වචනෙන් තේරුමක් ලැබෙන්නෙත් නැහැ )

You had better go now
දැන් ඔයා යන එක හොදයි

She had better take some medicine
ඇය බෙහෙත් ටිකක් ගන්න එක හොදයි

He had better listen to his wife
ඔහු ඔහුගේ බිරිදට ඇහුම්කන් දෙන එක හොදයි

They had better take a decision
ඔවුන් තීරණයක් ගන්න එක හොදයි

You had better drive carefully
ඔයා ප්‍රවේශමෙන් ඩ්‍රයිව් කරන එක (වාහන එලවන එක ) හොදයි

You had better apologize for your mistake
ඔයා ඔයාගේ වැරැද්දට සමාව අල්ලන එක හොදයි

They had better leave early
ඔවුන් කලින්ම පිටත් වෙන එක හොදයි

We had better double-check the documents
අපි ලියකියවිලි දෙවරක් පරීක්ෂා කරන එක හොදයි

He had better save some money
ඔහු ටිකක් සල්ලි ඉතුරු කරන එක හොදයි

You had better speak politely
ඔයා ආචාරශීලි ලෙස කතා කරන එක හොදයි

We had better book the tickets early
අපි කලින් ටිකට් බුක් කරගන්න එක හොදයි

You had better tell the truth
ඔයා ඇත්ත කියන එක හොදයි

He had better prepare for the test
ඔහු පරීක්ෂණයට ලෑහැස්ති වෙන එක හොදයි

She had better take a rest
ඇය විවේකයක් ගන්න එක හොදයි

They had better follow the rules
ඔවුන් නීති රීති පිළිපදින එක හොදයි

We had better call a doctor right now
අපි වහාම වෛද්‍යවරයෙක් කැදවන එක හොදයි

He had better wait a little.
ඔහු ටිකක් ඉන්න එක හොඳයි

- කට වහරේදී මෙහි had අයින් කරලත් භාවිතා වෙනවා

You better take a decision
ඔයා තීරණයක් ගන්න එක හොදයි

She better take doctor's advice
ඇය වෛද්‍ය වරුන්ගේ උපදෙස් ගන්න එක හොදයි

They better do something about this
ඔවුන් මේ ගැන යමක් කරන එක හොදයි

We better ask him first
අපි මුලින්ම ඔහුගෙන් අහන එක හොදයි

You better go home now
ඔයා දැන් ගෙදර යනඑක හොදයි

He better take care of his health
ඔහු ඔහුගේ සෞඛ්‍ය රැක ගන්න එක හොඳයි

- මීලගට එහි නැතාර්ථය බලමු . ඒ කියන්නේ යමක් නොකරන එක හොදයි කියලා කියන හැටි .මෙය අවවාදයක් හෝ නිර්දේශයක් වශයෙන් ප්‍රකාශ කෙරෙන්නක්

You had better not waste your time
ඔබ කාලය නාස්ති කරන්නේ නැත්තම් හොදයි

You had better not get late for school
ඔයා ස්කෝලෙට පරක්කු නොවෙන එක හොදයි

She had better not skip breakfast
ඇය උදේ අහාරය මඟ නොහරින එක හොදයි ( skip - ස්කිප් - මඟ හරිනවා )

He had better not drive too fast
ඔහු අධික වේගයෙන් රිය ධාවනය නොකරන එක හොදයි

They had better not argue with the teacher
ඔවුන් ගුරුවරයා සමග වාද නොකරන එක හොදයි

We had better not ignore this warning
අපි මේ අනතුරු හාඟවීම නොසලකා නොහරින එක හොදයි

You had better not spend all your money
ඔයා ඔක්කොම සල්ලි වියදම් නොකරන එක හොදයි

He had better not forget the past
ඔහු අතීතය අමතක නොකරන එක හොදයි

She had better not eat too much sugar
ඇය ගොඩක් සීනි නොකන එක හොදයි

They had better not make noise at night
ඔවුන් රාත්‍රියේ ශබ්ද නොකරන එක හොදයි

We had better not wait until the last minute
අපි අවසන් මොහොත දක්වා රැඳී නොසිටින එක හොදයි

You had better not be late.
ඔයා පරක්කු නොවී ඉන්න එක හොඳයි.

He had better not tell anyone.
ඔහු කාටවත් නොකියන එක හොඳයි.

You had better not go there.
ඔයා එතනට නොයන එක හොඳයි.

හොදයි , මේ අදහසම මීට ආසන්න වශයෙන් සමාන ලෙස දෙන්න පුළුවන් තව රටාවක් මේ

- It’s good for + පුද්ගලයා + to + ක්‍රියාව

නමුත් මේක had better වලින් කියවෙන අදහස වගේ ශක්තිමත් අදහසක් නෙවෙයි . Had better වලින් කියවෙන්නේ තරමක් දැඩි අවවාදයක් හෝ යෝජනාවක් හෝ අදහසක් ඉදිරිපත් කිරීමක් . නමුත් මින් ඒ අදහස ඊට වඩා බොහෝ ලිහිල්ව ඉදිරිපත් වෙන්නේ

බලමු උදාහරණ ටිකක්

It’s good for you to go there
ඔයාට එහෙ යන එක හොදයි

It’s good for everyone to be ready in advance
කලින් සූදානම් වෙලා ඉන්න එක හැමෝටම හොදයි

It’s good for him to change his manners
ඔහුට ඔහුගේ ගතිගුණ වෙනස් කරගන්න එක හොදයි ( manners - මැනර්ස් - ගති ස්වභාවයන් , ගතිගුණ )

It’s good for you to rest a little.
ඔයාට ටිකක් විවේක ගන්න එක හොඳයි

It’s good for us to leave early.
අපි කල් තියා පිටත් වෙන එක හොඳයි

It’s good for her to talk to her parents.
ඇයට ඇගේ දෙමව්පියන් සමඟ කතා කරන එක හොඳයි

It’s good for them to follow the rules.
ඔවුන් නීති අනුගමනය කරන එක හොඳයි

It’s good for him to listen to his wife
ඔහු ඔහුගේ බිරිඳට ඇහුම්කන් දෙන එක හොදයි

It’s good for you to drink more water.
ඔයා වැඩියෙන් වතුර බොන එක හොඳයි

It’s good for us to plan ahead.
අපි කලින් සැලසුම් කරන එක හොඳයි (ahead - අහෙඩ් - ඉදිරියට , ඉදිරියෙන් කියන අදහස දෙන පදයක් )

It’s good for her to get enough sleep.
ඇයට ප්‍රමාණවත් නින්දක් ගන්න එක හොඳයි

It’s good for children to play outside.
ළමයින් එළියට ගිහින් සෙල්ලම් කරන එක හොඳයි

It’s good for everyone to arrive on time.
හැමෝම වෙලාවට එන එක හොඳයි

It’s good for him to apologize.
ඔහු සමාව ඉල්ලන එක හොඳයි

It’s good for you to ask questions.
ඔයා ප්‍රශ්න අහන එක හොඳයි

It’s good for us to stay calm.
අපි සන්සුන්ව ඉන්න එක හොඳයි (stay calm - ස්ටේ කාම් - සන්සුන්ව සිටිනවා )

It’s good for her to learn English
ඇය ඉංග්‍රීසි ඉගෙන ගන්න එක හොඳයි

It’s good for them to work together.
ඔවුන් එකට වැඩ කරන එක හොඳයි

It’s good for us to wait a little longer and see what happens
අපි ටිකක් ඉඳලා වෙන්නේ මොකක්ද කියල බලන එක හොදයි

- මේකේ නැතාර්ථය එන්නේ මෙහෙම

It’s not good for + පුද්ගලයා + to + ක්‍රියාව

It’s not good for you to skip meals.
කෑම වේල් මඟහැරීම ඔයාට හොඳ නැහැ

It’s not good for you to stay up late
රෑ වෙනකල් ඇහැරන් ඉන්න එක ඔයාට හොඳ නැහැ (stay up late - ස්ටේ අප් ලේට් - නොනිදා ඉන්නවා )

It’s not good for children to eat too much junk food.
ළමයින්ට ඕනවට වඩා කෙටි කෑම කන එක හොඳ නැහැ

It’s not good for us to argue all the time.
හැම වෙලාවෙම වාද කරන එක අපිට හොඳ නැහැ

It’s not good for him to drive when he is tired.
මහන්සි වෙලාවේ රිය පැදවීම ඔහුට හොඳ නැහැ

It’s not good for them to ignore the rules.
නීති නොසලකා හරින එක ඔවුන්ට හොඳ නැහැ

It’s not good for you to sit in front of the computer all day.
දවස පුරාම කොම්පියුටරේ ඉස්සරහා ඉඳගෙන ඉන්න එක ඔයාට හොඳ නැහැ

It’s not good for her to skip classes.
ඇය පන්ති මඟහැරීම හොඳ නැහැ

It’s not good for you to use your phone while driving.
ඔයා රිය පදවන ගමන් ෆෝන් භාවිතා කරන එක හොඳ නැහැ

It’s not good for them to arrive late everyday .
ඔවුන් හැමදාම ප්‍රමාද වෙලා එන එක හොඳ නැහැ

It’s not good for us to talk loudly here.
අපි මෙතන හයියෙන් කතා කරන එක හොඳ නැහැ

It’s not good for children to play near the road.
ළමයින් පාර ළඟ සෙල්ලම් කරන එක හොඳ නැහැ

It’s not good for you to ignore her
ඔයා ඇයව නොසලකා හරින එක හොඳ නැහැ

- යම් විදියකින් මෙහෙම කියන්න වුනොත්, “ ඔයා ආපු එක හොදයි , ඔයා මට කියපු එක හොදයි, අද වැස්සෙ නැති එක හොදයි “. එවැනි අදහසක ඇත්තටම ප්‍රකාශ වෙන්නේ ඒ ක්‍රියාව ගැන ඒ පුද්ගලයාගේ ප්‍රසාදය. අපි බලමු එවැනි අදහසක් කොහොමද පල කරන්නේ කියලා.

එවිට පාවිච්චි වෙන්නේ It is good that …….. කියන රටාව

It is good that you came
ඔයා ආපු එක හොදයි

It is good that you help her
ඔයා ඇයට උදව් කරන එක හොදයි

It is good that he realized his fault
ඔහු ඔහුගේ වරද අවබෝධ කරගත්තු එක හොදයි

It is good that you are trying to go abroad
ඔයා රට යන්න හදන එක හොදයි

It is good that you told me in time
ඔයා මට කලින්(වෙලා ඇතුව) කියපු එක හොදයි

It is good that she didn’t come
ඇය  නාපු එක හොදයි

It is good that I don’t have to go there again
මට ආපහු එහෙ යන්න නොවෙන එක හොදයි

It is good that they are not here
ඔවුන් මෙහෙ නැති එක හොදයි

It is good that you understand the situation
ඔයාට තත්ත්වය තේරෙන එක හොදයි

It is good that it didn’t rain today
අද වැස්සේ නැති එක හොදයි

It is good that she passed the exam
ඇය විභාගයෙන් සමත් වුන එක හොදයි

It is good that they accepted our request
ඔවුන් අපේ ඉල්ලීම පිළිගත්තු එක හොදයි

It is good that you didn’t waste your time
ඔබ ඔයාගේ වේලාව නාස්ති නොකළ එක හොදයි

It is good that he apologized to her
ඔහු ඇයගෙන් සමාව ගත්තු එක හොදයි

It is good that they found the missing bag
නැතිවුණු බෑග් එක ඔවුන්ට හම්බවුනු එක හොදයි

It is good that she didn’t know about this
ඇය මේ ගැන දන්නේ නැති එක හොදයි

It is good that she realized the truth
ඇය  සත්‍යය තේරුම් ගත්තු එක හොදයි

It is good that you didn’t come here yesterday
ඔයා ඊයේ මෙහෙ නාපු එක හොදයි

LESSON 45 **SPOKEN ENGLISH**

අපි මෙහිදී වෛද්‍යවරයෙක් මුන ගැසීමට වෙලාවක් වෙන්කර ගැනීමට කරන කතා බහක් ගැන බලමු. මෙවැනි කතා බහක් හසුරුවා ගත හැකි නම් ඔබ ඇත්තටම දක්ෂයි. නමුත් ඒ මට්ටමට ඔබේ ඉංග්‍රීසි භාෂා හැකියාවන් දියුනු කර ගැනීමට ඔබ තරමක් මහන්සි විය යුතුයි. ඒ සදහා ඔබ යම් තරමක කැපවීමක් කල යුතුමයි. නමුත් එය අමාරු දෙයක් නෙවෙයි, ඔබේ උත්සාහය සහ කැපකිරීම මත ඔබට ඒ ප්‍රතිපලය ලගා කරගත හැකියි

A: Are numbers available to see Dr. Mel today?
ආ නම්බ(ර්)ස් අවේලබල් ටු සී ඩොක්ට(ර්) මෙල් ටුඩේ?
අද ඩොක්ට(ර්) මෙල්ව මුණගැහෙන්න නොම්බර තියෙනවාද?

B: Of course Madam, you can have number 19.
ඔෆ් කෝස් මැඩම්, යු කැන් හෑව් නම්බ(ර්) නයින්ටීන්.
අත්තවශයෙන්ම මැඩම්, ඔබට ගන්න පුළුවන් නොම්බර දහනමය.

A: When is the doctor coming?
වෙන් ඉස් ද ඩොක්ට(ර්) කම්ං?
ඩොක්ට(ර්) කීයටද එන්නේ?

B: He is coming at 4.30.
හී ඉස් කම්ං ඇට් ෆෝ ත(ර්)ටි.
ඔහු එන්නේ හතර හමාරට.

මෙයම තව විදියකට විමසන්න පුලුවන්

A: I want to meet Dr.Mel today . Can I have a number please ?
අයි වෝන්ට් ටු මීට් ඩොක්ට(ර්) මෙල් ටුඩේ . කැන් අයි හෑව් අ නම්බ(ර්) ප්ලීස් ?
මට අද ඩොක්ටර් මෙල්ව හමුවෙන්න අවශ්‍යයි. මට නොම්මරයක් ගන්න පුලුවන්ද ?

මේ තව විදියක්

A: Can I book an appointment to meet Dr. Mel today **?**
කැන් අයි(කැනයි) බුක් ඇන් ඇපොයින්මන්ට් ටු මීට් ඩොක්ට(ර්) මෙල් ටුඩේ ?
මට අද ඩොක්ටර් මෙල්ව මුනගැහෙන්න වෙලාවක් වෙන් කරගන්න පුලුවන්ද

B: Of course madam, you can have number 11
ඔෆ් කෝස් මැඩම් ,යු කැන් හෑව් නම්බ(ර්) 11
ඇත්තවශයෙන්ම මැඩම්, ඔබට නොම්මර 11 ගන්න පුලුවන්

A: What's the time of my appointment?
වට්ස් ද ටයිම් ඔෆ් මයි ඇපොයින්ට්මන්ට්?
මගේ ඇපොයින්ට්මන්ට් එකේ වෙලාව කීයද?

B: Time of your appointment is 7.40 and you have to be here by 7.15
ටයිම් ඔෆ් යුව(ර්) ඇපොයින්ට්මන්ට් ඉස් සෙවන් ෆෝටි. ඇන්ඩ් යූ හෑව් ටු බී හියු(ර්) බයි සෙවන් ෆිෆ්ටීන්.
ඔයාගෙ ඇපොයින්ට්මන්ට් එකේ වෙලාව හතයි හතලිහ. ඔබට හතයි කාල වෙනකොට මෙතන ඉන්න වෙනවා.

A: Okay. How much is the charge?
ඕකේ, හව් මච් ඉස් ද චා(ර්)ජ් ?
හරි, ගාන කීයද?

B: It's 2800.
ඉට්ස් ටූ තවුසන්ඩ් එයිට් හන්ඩ්‍රන්ඩ්.
දෙදාස් අටසීයයි.

A: How can I pay?
හව් කැනයි පේ?
මම කොහොමද ගෙවන්නේ?

B: You can pay online by logging on to our website or through e-channel, or else you can pay at our counter when you arrive for your appointment
යූ කැන් පේ ඔන්ලයින් බයි ලොගිං ඔන් ටු අව(ර්) වෙබ්සයිට් ඕ ත්‍රෲ ඊ-චැනල්, ඕ එල්ස් යූ කැන් පේ ඇට් අව(ර්) කවුන්ට(ර්) වෙන් යූ අරයිව් ෆෝ යුව(ර්) අපොයින්ට්මන්ට්

ඔබට ඔන්ලයින් (අන්තර්ජාලය මගින් ) ගෙවන්න පුළුවන් අපේ වෙබ් සයිට් එකට ඇතුළු වීමෙන් හෝ ඊ චැනල් හරහා, එහෙමත් නැත්නම් ඔබ මෙහෙට පැමිණීමේදී අපේ කවුන්ටරයේදී ගෙවන්න පුළුවන්. (or else -එහෙමත් නැත්නම්)

A: Okay ,please book the appointment. If I need to change the time later on I will let you know.
ඕකේ. ප්ලීස් බුක් ද ඇපොයින්ට්මන්ට්. ඉෆ් අයි නීඩ් ටු චේන්ජ් ද ටයිම් ලේට(ර්) ඔන් (ලේටරොන් ) අයි විල් ලෙට් යූ නෝ
හරි. ඇපොයින්ට්මන්ට් එක බුක් කරන්න.මට පස්සේ වෙලාවෙ වෙනසක් කරගන්න අවශ්‍ය වුනොත් මම දැනුම් දෙන්නම්.

B: If you want to change the time or cancel the appointment, please let us know before 5.O' clock. Thereby you can get the appointment cancelled without a cancellation fee
ඉෆ් යූ වොන්ට් ටු චේන්ජ් ද ටයිම් ඕ කැන්සල් දි ඇපොයින්ට්මන්ට්, ප්ලීස් ලෙට් අස් නෝ බිෆෝ ෆයිව් ඔ' ක්ලොක්. දෙයා(ර්)බයි යූ කැන් ගෙට් ද අපොයින්මන්ට් කැන්සල්ඩ් විතවුට් අ කැන්සලේෂන් ෆී

ඔබට වෙලාවෙ වෙනස් කරන්න අවශ්‍ය නම් හෝ ඇපොයින්ට්මන්ට් එක කැන්සල් කිරීමට අවශ්‍ය නම් කරුණාකර 5 ට පෙර අපට දැනුම්

දෙන්න. එමගින් ඔබට පුළුවන් අපොයින්මන්ට් එක කැන්සල් කරගන්න
අවලංගු කිරීමේ ගාස්තුවක් නැතුව

A: Sure ! I will let you know in time if I want to cancel the appointment. And I will pay at your counter, is that alright ?
ෂුව(ර්) ! අයි විල් ලෙට් යූ නෝ ඉන් ටයිම් ඉෆ් අයි වොන්ට් ටු කැන්සල් දි අපොයින්මන්ට්. ඇන්ඩ් අයි විල් පේ ඇට් යුව(ර්) කවුන්ට(ර්), ඉස් දැට් ඕල්රයිට් ?
සහතිකවම! මම ඕගොල්ලන්ට වෙලා ඇතුව දන්වන්නම් මට අපොයින්මන්ට් එක කැන්සල් කරන්න අවශ්‍ය නම් ,ඒ වගේම මම ඕගොල්ලන්ගෙ කවුන්ට(ර්) එකට ගෙවන්නම්, එහෙම හොද නේද ?

B: That's alright madam. We have booked your appointment
දැට්ස් ඕල්රයිට් මැඩම්. වී හැව් බුක්ඩ් යුව(ර්) ඇපොයින්ට්මන්ට්
එහෙම කමක් නෑ මැඩම් ,අපි ඔයාගෙ ඇපොයින්ට්මන්ට් එක බුක් කරලා තියෙන්නෙ

A: Thank you, will the doctor be on time ?
තැන්ක් යූ. විල් ද ඩොක්ට(ර්) බී ඔන් ටයිම් ?
ස්තෑතියි. ඩොක්ටර් වෙලාවට ඉදියිද ?

B: He is normally on time. But in some cases, like emergency operations, he gets a bit late to come here. However it doesn't happen everyday. He will most probably be on time today
හී ඉස් නෝමලි ඔන් ටයිම් , බට් ඉන් සම් කේසස්, ලයික් ඉම(ර්)ජන්සි ඔපරේශන්ස් , හී ගෙට්ස් අ බිට් ලේට් ටු කම් හිය(ර්) .හව්එව(ර්) ඉට් ඩස්න්ට් හැපන් එව්රිඩේ. හී විල් මෝස්ට් පොබබ්ලි බී ඔන් ටයිම් ටුඩේ
ඔහු සාමාන්‍යයෙන් වෙලාවට ඉන්නවා, නමුත් සමහර අවස්ථාවල, හදිසි සැත්කම් වගේ, ඔහු එන්න පරක්කු වෙනවා, කොහොමවුනත් ඒක හැමදාම වෙන දෙයක් නෙමෙයි. අද බොහෝවිට ඔහු වෙලාවට ඉදීවි

A: Ok, Thank you very much
ඕකේ තැන්ක් යූ වෙරි මච්
හොදයි , බොහොම ස්තූතියි

අපි බලමු ඩොක්ටර් හම්බ වෙන්න නොම්මර නැත්නම් මොකද වෙන්නේ කියලා

A Can I meet Dr.Mel today ?
කැනයි අයි මීට් ඩොක්ට(ර්) මෙල් ටුඩේ ?
මට අද ඩොක්ටර් මෙල්ව හම්බවෙන්න පුලුවන්ද ?

Can I book an appointment to see Dr. Mel today ?
කැනයි බුක් ඇන් අපොයින්මන්ට් ටු සී ඩොක්ට(ර්) මෙල් ටුඩේ ?
මට අද ඩොක්ට(ර්) මෙල් ව හම්බවෙන්න අපොයින්මන්ට් එකක් දාන්න පුලුවන්ද ?

B: Sorry madam, all the appointments are booked for today
සොරි මැඩම්, ඕල් අපොයින්මන්ට්ස් ආ බුක්ඩ් ෆෝ ටුඩේ
සමාවෙන්න මැඩම්, අදට ඔක්කොම අපොයින්මන්ට්ස් බුක් වෙලා ඉවරයි

Sorry madam, numbers are not available for today
සොරි මැඩම් , නම්බ(ර්ස්) ආ නොට් අවේලබල් ෆෝ ටුඩේ
සමාවෙන්න මැඩම්, අදට නොම්මර නැහැ

Dr. Mel is'nt available today
ඩොක්ට(ර්) මෙල් ඉස්න්ට් අවේලබල් ටුඩේ
අද ඩොක්ට(ර්) මෙල් නැහැ

Dr. Mel is not meeting patients today
ඩොක්ට(ර්) මේල් ඉස් නොට් මීටිං පේෂන්ට්ස් ටුඩේ
අද ඩොක්ටර් මේල් ලෙඩ්ඩු බලන්නේ නැහැ

A: When can I meet him next ?
වෙන් කැනයි මීට් හිම් නෙක්ස්ට් ?
මට ඊළගට කවදද ඔහුව හමුවෙන්න පුළුවන් ?

When can I see him next ?
වෙන් කැනයි සී හිම් නෙක්ස්ට් ?
මට ඊළගට කවදද ඔහුව හමුවෙන්න පුළුවන්

When is he coming next ?
වෙන් ඉස් හී කමිං නෙක්ස්ට් ?
ඔහු ඊලගට එන්නේ කවදද ?

When will he be available next ?
වෙන් වීල් හී අවේලබල් නෙක්ස්ට් ?
ඔහු ඊලගට ඉන්නේ කවදද ?

B: You can meet him on next Monday from 5.30
යූ කැන් මීට් හිම් ඔන් නෙක්ස්ට් මන්ඩේ ෆ්‍රොම් ෆයිව් ත(ර්)ටි
ඊලග සදුදා 5.30 ඉදලා ඔබට ඔහුව හමුවිය හැකියි

He is available on next Monday
හී ඉස් අවේලබල් ඔන් නෙක්ස්ට් මන්ඩේ
ඔහු ඊලග සදුදා ඉන්නවා

He will be here next Monday
හී විල් බී හිය(ර්) නෙක්ස්ට් මන්ඩේ
ඔහු ඊලග සදුදා මෙහෙ ඉදිවී

A: Alright , can I make an appointment for next Monday ?
ඕල් රයිට්, කැන් අයි මේක් ඇන් අපොයින්මන්ට් ෆෝ නෙක්ස්ට් මන්ඩේ ?
හරි, මට ඊලග සදුදට අපොයින්මන්ට් එකක් දාන්න පුලුවන්ද ?

Then, can you please book an appointment for me for next Monday ?
දෙන්,  කැන් යූ  ප්ලීස් බුක් ඇන් අපොයින්මන්ට් ෆෝ නෙක්ස්ට් මන්ඩේ ?
එහෙනම්, මට ඊලග සඳුඳදට අපොයින්මන්ට් එකක් බුක් කර දෙන්න ඔබට පුලුවන්ද

Please book a number for me for next Monday
ප්ලීස් බුක් අ නම්බ(ර්) ෆෝ මී ෆෝ  නෙක්ස්ට් මන්ඩේ
කරුණාකර මට ඊලග සඳුදට නොම්මරයක් බුක් කරන්න

What numbers are available ?
වට් නම්බ(ර්)ස් ආ අවේලබල්
මොන නොම්මරද තියෙන්නේ ?

When can I meet him next Monday ?
වෙන් කැන් අයි මීට්  හිම් නෙක්ස්ට් මන්ඩේ ?
ඊලග සදුදා කීයටද මට ඔහුව හමු වෙන්න පුළුවන් ?

B: We can book 5.45 for you madam, that is number two
වී කැන් බුක් 5.30 ෆෝ යූ  මැඩම් , දැට්  ඉස්  නම්බර් 2
අපිට පුළුවන් 5.30 බුක් කරන්න මැඩම් , ඒ කියන්නේ නොම්මර 2

We can book number two for you madam , the  time is 5.45
වී කන් බුක් නම්බර් 2 ෆෝ යූ  මැඩම් , ද ටයිම් ඉස් 5.45
අපිට නොම්මර දෙක බුක් කරන්න පුළුවන් මැඩම් , වෙලාව 5.45

A: Can I have it a little later ? I mean after 6 o'clock because my son comes back home at about 6. He has to accompany me
කැන් අයි( කැනයි)  හැව් ඉට්  අ ලිට්ල් ලේට(ර්) ? අයි මීන්  ආෆ්ට(ර්) සික්ස් ඔ ක්ලොක් බිකෝස්  මයි සන් කම්ස් බැක් හෝම් ඇට් අබවුට් සික්ස් . හී  හෑස් ටු අකොම්පැනි  මී
මට ඒක තව පොඩ්ඩක් පස්සට දා ගන්න බැරිද ? මං කියන්නෙ හයෙන් පස්සෙ වගේ, මගෙ පුතා ගෙදර එන්නෙ හයට විතර. එයාට තමයි මාව එක්ක එන්න වෙන්නෙ (accompany - ඇකොම්පැනි - කැටුව යනවා , එක්ක යනවා)

A: No problem madam , what about number 5 , then the time will be 6.30
නෝ ප්‍රොබ්ලම් මැඩම් , වට්  අබවුට් නම්බ(ර්) ෆයිව් , දෙන්  ද ටයිම් විල් බී සික්ස් තර්ටි
ප්‍රශ්නයක් නෑ  මඩම් , නම්බ(ර්) ෆයිව් මොකද ? එතකොට වෙලාව වෙන්නේ 6.30

No problem . Shall we book 6.30 for you ?
නෝ  ප්‍රොබ්ලම් , ෂැල් වී බුක් සික්ස් ත(ර්)ටි ෆෝ යූ  ?
ප්‍රශ්නයක් නෑ , අපි ඔබට 6.30 බුක් කරන්නද ?

A: 6.30 is fine
සික්ස් ත(ර්)ටි ඉස් ෆයින්
6.30 හොදයි

B; Ok madam , your appointment to meet Dr. Mel is for 6.30 next monday.
ඕකේ මැඩම් , යුව(ර්) අපොයින්මන්ට් ටු මීට් ඩොක්ට(ර්) මෙල් ඉස් ෆෝ සික්ස් ත(ර්)ටි නෙක්ස්ට් මන්ඩේ
හරි මැඩම් , ඩොක්ට(ර්) මෙල් ව හම්බ වෙන්න ඔයාගේ අපොයින්මන්ට් එක ඊලග සදුදා හයයි තිහට

A: Ok , thank you very much
ඕකේ තැන්ක් යූ වෙරි මච්
හරි බොහොම ස්තුතියි

B: You are welcome
යූ ආ වෙල්කම්
ඔබව(ස්තුතිය )පිලිගන්නවා

**Vocabulary 45**

Double check – ඩබල් චෙක් – නැවත වරක් පරීක්ෂා කරනවා

Counter – කවුන්ට(ර්) – කවුන්ටරය

Charge – චාජ් – ගාස්තුව , ගාස්තු අය කරනවා

Accompany – ඇකොම්පැනි – සමඟ යනවා , කැටුව යනවා

Wipe – වයිප් – පිස දමනවා / මකනවා

Windscreen – වින්ඩ්ස්ක්‍රීන් – වාහනයේ ඉදිරි වීදුරුව

Cereal – සීරියල් – ධාන්‍ය ආහාර

Spoiled – ස්පොයිල්ඩ් – නරක් වූ / පුරුදු කර නරක් කළ

Unspoiled – අන්ස්පොයිල්ඩ් – නරක් නොවූ / ස්වාභාවික තත්ත්වයේ ඇති

Fair – ෆෙය(ර්) – සාධාරණ / යුක්තිසහගත

Unfair – අන්ෆෙය(ර්) – අසාධාරණ

Fare – ෆෙය(ර්) – ගාස්තුව / ප්‍රවාහන ගාස්තුව

Troublesome – ට්‍රබල්සම් – කරදරකාරී / ගැටලු ඇති කරන

Troubleshoot – ට්‍රබල්ෂූට් – දෝෂ සොයා නිවැරදි කරනවා

Stray – ස්ට්‍රේ – අතරමං වූ / මාර්ගයෙන් ඉවතට ගිය

Stray Dog – ස්ට්‍රේ ඩොග් – අයාලේ යන බල්ලා

Strict – ස්ට්‍රික්ට් – දැඩි , තද (නීති, රීති, විනය ආදිය)

Strictly – ස්ට්‍රික්ට්ලි – දැඩි ලෙස , තදින්

Steer – ස්ටිය(ර්) – වාහනය හසුරවනවා , මෙහෙයවනවා

Steering Wheel – ස්ටිය(ර්)රිං වීල් – සුක්කානම

Rush – රෂ් – ඉක්මන් වෙනවා , ඉක්මනින් යනවා

Rush Hour – රෂ් අව(ර්) – අධික තදබදය ඇති වේලාව , කලබල වෙලාව

Prince – ප්‍රින්ස් – කුමාරයා

Princess – ප්‍රින්සෙස් – කුමාරිකාව

Legitimate – ලෙජිටිමේට් – නීත්‍යානුකූල, වලංගු

Lend – ලෙන්ඩ් – ණයට දෙනවා

Lender – ලෙන්ඩ(ර්) – ණය දෙන්නා

Length – ලෙන්ත් – දිග

Height – හයිට් – උස

Width – විඩ්ත් – පළල

Lengthy – ලෙන්ති – දිගු, විස්තරාත්මක

Preserve – ප්‍රිස(ර්)ව් – ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම

Preservation – ප්‍රිසර්වේෂන් – සංරක්ෂණය, ආරක්ෂාව

Lime – ලයිම් – දෙහි, හුණු

Limit – ලිමිට් – සීමාව / සීමා සහිත / සීමා කරනවා

Limited – ලිමිටඩ් – සීමිත, සීමා වූ

Myth – මිත් – මිථ්‍යාව, පුරාවෘත්ත කතාව

Beard – බියර්)ඩ් – රැවුල

Mustache – මුස්ටාෂ් – උඩු රැවුල

Mustard – මස්ට(ර් )ඩ් – අබ

Obstruct – ඔබ්ස්ට්‍රක්ට් – බාධා කරනවා , අවහිර කරනවා

Obstruction – ඔබ්ස්ට්‍රක්ෂන් – බාධාව, අවහිරතාව

Novice – නොවිස් – නවකයා, ආධුනිකයා ,අත්දැකීම් අඩු පුද්ගලයා

Era – ඊරා – යුගය, කාල පරිච්ඡේදය

Manioc – මැනියොක් – මඤ්ඤොක්කා

Melody – මෙලඩි – තනුව

Melodious – මෙලෝඩියස් – මියුරු, සංගීතමය, කන්කලුසුළු